


# දේදුන්නක පාට

ගී සඳැළුව වෙන්වෙන්නේ ගීතයක පසුබිම පිලිබඳව සටහන් තැබීමයි. ගීතාවලියක පසුබිම පිලිබඳවත්, ඒ ගීතාවලිය ඇසුරින් පැවැත්වෙන ප්‍රසංගයක පසුබිම පිලිබඳවත් සටහන් තැබීමට මෙවර ගී සඳැළුවේ ඉඩකඩ වෙන්වෙනවා.

ගීතාවලිය ළමා ගී එක්වුණ "අතුරු මිතුරු" ගී එකතුවයි. ප්‍රසංගය එහි ගී පෙළ ගැන් වී මාර්තු 18 වන ඉරිද සවස 5.00 ට බර්වුඩ්හි කෙල් වොට්සන් රඟහලේදී ඉදිරිපත් වෙන " අතුරු මිතුරු" ළමා ප්‍රසංගයයි.

ළමා ගී පද රචනා අපගේ අනෙක් නිර්මාණ අතරට එක් වුණේ මුල පටන්මයි. ඒ අතරින් ළමා ගීතයක් බවට පත්වුණේ "මල් පියලි පාව යාවී.." පද රචනාවයි. ඒ විශාරද දීපිකා ප්‍රියදර්ශනියගේ තනු හා සංගීත නිර්මාණයක් ලෙසින් නුගේගොඩ අනුලා විද්‍යාලයේ බාලිකා-වෝ මේ ගීය සමස්ථ ලංකා ගායනා තරඟ වලට ගැයුවා. මුලින්ම පටිගත වුණ ගීය වුණේ, "දේදුන්නක පාට..." ගීතයයි. ලංකාවේ " ලක්හඬ" ගුවන් විදුලිය වෙනුවෙන් අවිස්සාවේල්ලේ ආනන්ද රාජපක්ෂ විශාරදවරයා මේ ගීයේ තනුව හා සංගීතය නිර්මාණය කළා.

මෙල්බර්න් නුවර දරු දැරියන් සඳහා ශිරෝමා ප්‍රනාන්දු නිෂ්පාදනය කළ" ඉතින් නිවුණා ද ළය ගිනි ?" චිත්‍රපටයේ ළමා ගීයයි "අතුරු මිතුරු" ගීය. එය ලියැවුණේ තරුපති මුණසිංහ තරුණ සංගීතවේදියාගේ තනුවටත්, රුක්මල් නිරෝෂ් තරුණ අධ්‍යක්ෂවරයාගේ චිත්‍රපට දර්ශන වලටත් අනුවයි. මේ ගීය ගුවනින් ඇසු දෙරන ආයතනයේ ඩෙන්සිල් ජයවීර සොයුරා ළමා ගී එකතුවක් නිෂ්පාදනය කිරීමට කළ ඇරයුමේ ඵලයයි "අතුරු මිතුරු" ගී එකතුව.

මේ ගී එකතුව සඳහා හසිනි ඉළංගරත්න, සරිනි දිසානායක යන මෙල්බර්න් දැරියන් දෙදෙනාත්, තිසල් පාදුක්කවිතාන සිඩ්නි දැරවාත්, මනීෂ විජේකෝන් මහනුවර දරුවාත්, හංසිකා සඳලි ඩයස් කොළඹ දැරියත් මුලිකව ගායනයෙන් දයක වුණා. ඊට අමතරව පිරිසක් වශයෙන් ගයන සමුහ ගායනාවලයටත් අනෙක් ගායන සඳහාත් සහාය ගායනා වලටත් තවත් දරු දැරියන් තිස් හතර දෙනෙක් එක් වුණා.

ගායනයට විශාරද නන්ද මාලනී, ආචාර්ය වික්ටර් රත්නායක, නිරෝෂා විරාජිනී, විශාරද රෝහණ ධර්මකීර්ති, සහන් රන්වල යන ප්‍රවීණ ගායක ගායිකාවන් දයක වුණා. සංගීතයෙන් ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න, ආචාර්ය වික්ටර් රත්නායක, රෝහණ වීරසිංහ, තරුපති මුණසිංහ, විශාරද රෝහණ ධර්මකීර්ති, සහන් රන්වල වැනි ප්‍රවීණයින් මෙන්ම, නිර්මල හේරත්, විශාරද ආනන්ද රාජපක්ෂ, සමන් රණබාහු, වාසනා වීරකෝන් යන පිරිස ද එක්වුණා.

*දේදුන්නක පාට වෙනම*
*වෙන් කළාම මොනවද වෙන්නේ ?*
*පන් පැදුරක පන් කොල ටික*
*වෙන් කළාම මොනවද වෙන්නේ ?*

*පාට - පාට එකට ඇදී*
*අඳුරු අහසෙ හැඩ මවන්න*
*ජාති - ජාති එකමුතු වී*
*දිනුව දෙරන හැඩකරන්න*
*ඇයි නොසිතන්නේ ?*

*රෑන - රෑන එකට වේලී*
*රටා පැදුර වියාගන්න*
*දෑත - දෑත එකට බැඳී*
*සමඟි බලය රජකරන්න*
*ඇයි පැකිලෙන්නේ ?*

***තනුව හා සංගීතය :***
*විශාරද ආනන්ද රාජපක්ෂ*

***ගායනය :***
*නතාෂා පෙරේරා*
*සචිනි කොතලාවල*
*ගයාෂා සමරනායක*
*ජනනි අමා*

***රචනය :*** *සිසිර දිසානායක*




To Page 20


# LANKAN AUTO CARE

**Licensed Roadworthy Tester (R.W.C)**



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC



MELWAY REF 89 J 5

Ranjith Perera
Mob: 0409 866 886

**9798 2200**

**14/30 Tower Court**
**Noble Park 3174**

# MONT ALBERT DENTISTS P/L

For all Your Dental Requirements

We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS
FOR FAMILIES,
FREE CHECK UPS
FOR KIDS UNDER
7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS

2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)